## මෙන්න! නොමිලේ කරන මහඟු සේවයක් !

අවශ්‍ය අයට නොමිලයේ දීම සඳහා ඉතා පරෙස්සමෙන් පාවිච්චිකරන ලද හොඳ ඇඳුම්, ඇඳරෙදි, කර්ටන් තිරරෙදි මෙන්ම පුටුමේස ආදී ගෘහ භාණ්ඩ රාශියක් ඇත. එක්සත් රාජධානියේ ශ්‍රීලාංකික ආදායම් අඩු පවුල් හෝ ඉගෙනුම ලබන ශිෂ්‍යයින් හෝ සිටීනම් ඒවා ඒ අයට දීමට හැකිය. මෙම ඊමේල් ලිපිනයට දන්වන්න. **projectlanka@gmail.com**



## 2.5 Acres Land for Sale - Athurugiriya
### අතුරුගිරියේ අනර්ඝ ඉඩමක් විකිණීමට

Valuable land facing newly carpeted road frontage.
House with Water, Electricity and Telephone.
Land has King Coconut, Jack, Teak, and Nedun Trees.
Suitable for Housing, Agriculture or Farming.
35 mnts drive from Colombo central.

*For Immediate Sale*

**Contact - Mr Jayasinghe - 0094 11 2762388**
**Email - azmath@vibesevents.biz**



## House for Sale නිවසක් විකිණීමට ඇත

**Modern, up-stair house with AC in Nugegoda. 3- Bedrooms with en-suite bathrooms. Highly residential and secure. Modern kitchen, solar power hot water, garage, separate servants' toilet & shower. Price - Rs. 21 Million.**
**Payments can be made in Pounds/ Rupees or both**

**Tel. in SL: 0094112 825 900**
**Tel. in UK: 0208 450 6704**



## ලිහිණියා LIHINIYA

ශ්‍රීලංකා අවන්හල සහ වෙළඳසල
***ප්‍රණීත ආහාර සැපයීමේ පුරෝගාමියෝ***
එවලේම පිළියෙල කරන ආප්ප, ඉඳිආප්ප
පිට්ටු, රොටි කොත්තු, බුරියානි
***උත්සව සඳහා ඇණවුම් බාරගනු ලැබේ.***
කුළුබඩු වර්ග ඇතුළු විවිධ ශ්‍රීලංකා නිශ්පාදන
*ලිහිණියා විශේෂ නිශ්පාදනයක් වන*
**බැදපු සහ අමු තුනපහ දැන් ඉතා ජනප්‍රියයි**

**Tel. 0208 450 9052**
**66 Cricklewood Broadway, London NW2 3EP**



**වසර ගණනාවක් පුරා ශ්‍රීලාංකික ජනතාවගේ හදවතට වඩාත් සමීපව කටයුතු කරන නැව් බඩු ආයතනයයි**

## සත්සමුදුර ජයගත් ට්‍රයිකෝ

♦ ට්‍රයිකෝ - කොළඹ
50 සිරිල් සී පෙරේරා මාවත
කොළඹ 13
දුරකතනය 4 4 8 2 7 0 / 4 3 2 2 3 6

♦ ට්‍රයිකෝ - ගාල්ල ♦ ට්‍රයිකෝ - කුරුණෑගල

**සතියක් ඇර සතියක්, එනම් මසකට දෙවරක් ට්‍රයිකෝ නැව්බඩු ලංකාවට යැවේ. දින 17 කින් ඒවා ලංකාවට ළඟාවේ.**

## TRICO
## Shipping & Forwarding Ltd

**555 White Hart Lane**
**London N17 7RP**
Telephone 0 2 0 8 8 8 8 8 7 8 7
Fax 0 2 0 8 8 8 9 5 4 4 5
E-Mail : trico@tricoshipping.com

***නැව්බඩු සඳහා පූර්ණ විශ්වාසය තැබිය හැකි ආයතනය***




## ප්‍රශ්න ඇසීම

**නී**තිඥයෙක් ලන්ඩනයේ සිට සිය රටට ගුවනින් යමින් සිටියේය. ගුවන්යානයේ යාබද අසුනේ හිඳගෙන නිදි කිරා වැටෙමින් සිටියේ විශ්‍රාමික මහලු පුද්ගලයෙකි. මේ නීතිඥයා විශ්‍රාමිකයින් ගණන් ගත්තේ නූගත් මෝඩයින් ලෙසට ය. මහල්ලා ගොනාට අන්දා ගණනක් කොටා ගනිමියි අදිටනින් යුතුව නීතිඥයා මහල්ලාට මේ යෝජනාව ගෙනාවේ ය.

" නිදිමත යන්නත් එක්ක අපි දෙන්නා පොඩි විනෝදාත්මක ක්‍රීඩාවක් කරමුද......?"

" මොකක්ද ක්‍රීඩාව...... ?" මහල්ලා ඇසීය.

" ක්‍රීඩාව මේකයි..... මම ඔහේගෙන් ප්‍රශ්නයක් අහනවා. ඔහේට උත්තර දෙන්න බැරිවුනොත් ඔහේ මට ඩොලර් 5 ක් දෙන්න ඕන. හරිද? ඊළඟට ඔහේ මගෙන් ප්‍රශ්නයක් අහන්න. මට ඒකට උත්තරදෙන්න බැරිවුණොත්, මම දෙනවා ඔහේට ඩොලර් 500 ක්..... හරිද....?"

මහල්ලා ඔළුව වනා කැමති විය.

" මෙන්න මගේ ප්‍රශ්නය.... පොළවෙ ඉඳලා හඳට කොච්චර දුරද....? "

මහල්ලා එය දන්නේ නැත. ඔහු ඩොලර් 5 ක් ගෙන නීතිඥයාගේ අත තැබීය. දැන් ඔහුගේ වාරයයි. ඔහු නීතිඥයාගෙන් මෙසේ ඇසීය.

" කන්ද උඩට කකුල් තුනෙන් නැගගෙන ගිහිල්ලා.... ආපහු පහලට එන්නේ කකුල් හතරකින්.... මොකක්ද ඒ....? "

නීතිඥයා අන්දමන්ද විය. ඔහු වහාම තම ලැප් ටොප් පරිගණකය ගෙන වෙබ් අඩවි පිරික්සා තොරතුරු සෙවීය. ලොවපුරා සිටිනා ස්මාර්ට් යහලුවන්ට පණිවුඩ යැවීය. පැය දෙක තුනක් මෙසේ ගතවුණත් උත්තරය ලැබුණේ නැත.

අන්තිමේ ඔහු ඩොලර් 500 ක් ගෙන මහල්ලා අත තබා මෙසේ කීවේය. " මම පරාදයි.... මෙන්න පොරොන්දු වෙච්ච සල්ලි...."

මහල්ලා ඒ මුදල සාක්කුවේ දාගෙන අනික් පැත්තට හැරී නිදන්නට වන්නේය.

නීතිඥයාට යකා නැග්ගේය.

" කෝ ඉතින් තමුසෙ කියනවා උත්තරේ...කන්ද උඩට කකුල් තුනෙන් නැගගෙන ගිහිල්ලා... ආපහු පහලට එන්නේ කකුල් හතරකින්... මොකක්ද ඒ... කියනවා....? "

මහල්ලා කිසිත් නොකියා සාක්කුවෙන් ඩොලර් 5 ක් ගෙන එය නීතිඥයා අත තබා අනික් පැත්තට හැරී නිදන්නට වන්නේ ය.

## හුණු ගෑම

**සො**යිසා මහත්මියගේ නිවසෙහි සොල්දරයේ බිත්තිවල හුණු ගෑමේ කටයුතු සිදුවෙමින් සිදුවෙමින් තිබිණ. එහෙත් එය භාරව සිටි බාසුන්නැහේ කම්මැලිකමෙන් වැඩය අත පසු කරනවායයි ඇය චෝදනා නැගුවාය. දිනක් ඔහු සොල්දරයේ සිටිද්දී කිසිදු හඬක් නොඇසුණු නිසා සොයිසා මහත්මිය හිණිපෙළ අසලට ආවාය. .. "

" බාස් උන්නැහේ වැඩ ද.... ? "
ඇය හඬ නගා ඇසුවාය.

" ඔව් මැඩම්! මම හුණු ගානවා...."
බාස් උන්නැහේ පිළිතුරු දුන්නේය.

" කෝ.... ඒ වුනාට මට නම් කිසිම සද්දයක් ඇහෙන්නෙ නෑ...."
ඇය කීවේ සැකයෙනි.

" මම හුණු ගාන්නෙ මැඩම් බුරුසුවෙන්.... එහෙම නැතුව කුලුගෙඩියකින් නෙවෙයි..."

එවිට ඔහු ගත් කටටම කීවේය.


***ලංකා විත්ති පුවත්පතේ පළවන ලිපි අදහස් හා දැන්වීම් ඒවා පළකරන අයගේය. ඒ පිළිබඳව කර්තෘගේ කිසිදු වගකීමක් නැත.***

***ලංකාවිත්ති පත්‍රය අවුරුද්දක් ඔබේ ගෙදරට ගෙන්වාගන්නට පවුම් 12 ක චෙක්පතක් Lanka Viththi යනුවෙන් ලියා පහත සඳහන් ලිපිනයට එවන්න.***

**Lanka Viththi**
**P. O. Box 64678,**
**London NW3 9LS**




## කඹයක් මෙන් අඹරා - ඔසවා ගත් පිඹුරා

**Members of staff at London Zoo carry Big Bertha, a 16 foot Burmese Python called Big Bertha, from the Veterinary Hospital to the zoo's Reptile House, after the newly arrived snake finished her quarantine period.** මේ නොබෝදා ලන්ඩන් සත්ව උද්‍යානයට අළුතෙන් ගෙන ආ අඩි 16 ක් දිග දැවැන්ත බුරුම පිඹුරා ඇතුල්වීමේදී සත්ව රෝහලේ කරන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් පසු උද්‍යානයේ 'සර්ප නිවස' වෙත සේවක පිරිසේ අය විසින් ගෙන යනු ලබන අයුරු.

## Big Bertha makes a very big entrance:
### London Zoo welcomes new 16 ft python
### (but it takes five people to carry her in)

At 16ft, Big Bertha couldn't help but make a big entrance as she arrived at London Zoo.

The giant Burmese Python was taken into her new home for the first time yesterday by a team of five zookeepers.

The snake - which weighs approximately 80 kilograms - had been held in the veterinary hospital where she was held in quarantine after her arrival.

The Burmese Python is the largest subspecies of the Indian Python and one of the six largest snakes in the world. It is native to a large variation of tropic and subtropic areas of South and Southeast Asia.

They are often found near water and are sometimes semi-aquatic, but can also be found in trees.

They average 12ft in length, but can grow as long as 19ft.

**මේ** පිඹුරාගේ දිග අඩි 16 කි. බර කිලෝ 80 කි. ඇයට නම තබා ඇත්තේ ලොකු බර්තා යනුවෙනි. ආසියානු රටකින් ගෙන එන ලද මේ දැවැන්ත පිඹුරු සතා ඔසවාගෙන යාමට රීජන්ට් පාක් හි ලන්ඩන් සත්ව උද්‍යානයේ සේවක සේවිකාවන් 6 දෙදෙනෙකු අවශ්‍ය විය.

බුරුම පිඹුරා යනුවෙන් හඳුන්වන මේ වර්ගය ඉන්දියානු පිඹුරු වර්ගයට අයත් කොටසක් වන නමුදු ඉන් බෙදී විශාල වුණු අළුත් පිඹුරු වර්ගයකි. අඩි 12 සාමාන්‍ය දිග නමුත් අඩි 19 දක්වා වැඩෙන්නටද පුළුවන. මෙම වර්ගය දැනට ලොව ඇති විශාලතම පිඹුරු වර්ග හයෙන් එකක් ලෙස හඳුනාගෙන ඇත. .

මේ බුරුම පිඹුරන් උණුසුම් දේශගුණයට හුරුවූ අය වන අතර වතුර වළවල් ළඟ මෙන්ම ගස්වල ද සිටිනු දක්නට හැකිය.

## ජේසුතුමා වගේ මට මැරෙන්න ඕනෑ!

**ආ**ගමට පල්ලියට බොහොම ලැදිකමක් දක්වන භක්තිමත් කතෝලිකයෙකු වූ හැඳල පැත්තේ විශ්‍රාමලත් විදුහල්පතිවරයෙක් මරණාසන්න මොහොතේ එයාව බලන්න ඇවිත් හිටපු ඥාති මිත්‍රාදීන්ට මෙහෙම කිව්වලු.

" මම මේ සුවර්ගෙට යන්න සූදානම්වෙලා ඉන්න මොහොතේ මගේ හිත සන්සුන් කරගන්න ඕන.... ඒක හන්ද මේ අපේ දොස්තර මහත්තෙයයි පෙරකදෝරු මහත්තෙයයි ඉතුරු වෙන්න අනෙක් උදවිය සේරම එළියට ගියොත් හොඳයි..... එතකොට මට නිදහසේ හුස්ම ටික ඇරගන්න පුළුවන්..."

මේ කතාව අහගෙන හිටපු මරණාසන්න විදුහල්පතිවරයගෙ බිරිඳ කිව්වලු

" ඇයි අනේ ඔයා දොස්තර මහත්තෙයයි පෙරකදෝරු මහත්තෙයයි විතරක් තියාගන්නෙ.... මුළු ජීවිත කාලෙම ඔයා ළඟින් හිටපු මං මේ අවසාන මොහොතෙත් ළඟින් උන්නම මොකද..?" කියලා.

එතකොට මරණාසන්න විදුහල්පතිවරයා කිව්වලු මෙහෙම කතාවක්.

" වයලට් නෝනේ.... මටත් මියැදෙන්න ඕනේ අපේ ජේසුතුමා වගේ....කුරුසියේ තියල ඇණ ගහන කොටත් උන්නාන්සෙ ළඟින්ම දෙපැත්තෙ හිටියෙ මිත්‍ර වේශයෙන් පෙනී හිටපු හොරු දෙන්නෙක් නේ..."

♦ ***සරත්චන්ද්‍ර පත්තඩුවන*** *Sri Lanka*


## SHANTHI & CO ❋❋❋❋❋
**Solicitors & Commissioners for Oaths**

**We are an established law firm in North London**
Specialising in Immigration matters ( Visas, **Tier 1** General - Highly Skilled Migrants / **Tier 2** Skilled Workers (WorkPermits), Students, Domestic Workers, Appeals - Judicial Reviews etc.)
♦ Residential / Commercial Conveyancing
♦ Landlord and Tenant Disputes ♦ Divorce ♦ Employment Law
♦ General Litigation ( Sale of Goods, Services, Debts etc.)
♦ We offer comprehensive services on legal maters in Sri Lanka
***Contact*:- Shanthi Senadheera** (*Solicitor*) **Padmini Senadheera** (*Solicitor*) **Dinu Senadheera** (*Solicitor*)

**206 Seven Sisters Road, Finsbury Park, London N4 3NX**
**Tel. 020 7561 9494 Fax 020 7561 9495**
**Emergency: 07956 129 642 shanthi.co@btconnect.com**